## අෂ්ටම වංගුව

### අවුරුද්ද

ඇත්තම කියන්න ලබන්නා වූ සිංහල අළුත් අවුරුද්ද අපේ සංස්කෘතික උත්සවයක් ලෙස පැවරීම නම් මගෙන් මග හැරිලා බොහොම කල්. ලංකාවේදී නම් අමාරුවෙන් හරි අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර දෙක තුනක් හරි පිලි පැද්දත් මෙහෙදි මේ නැකත් යෙදිලා තියෙන වෙලාවල් එක්ක කොහොමද අපි වැඩ කරන්නේ. ඒත් ඉතිං කිරිබතක් කැවිලි පෙවිලි ටිකක් වෙලාව පහුවෙලා හරි හදන්න අමතක කරන්නේ නැහැ.



නැකත් කියන්නෙත් වෙලාවටනේ. හිත හොඳින් හොඳ වැඩක් කරනවා නම් දවසේ කොයි වෙලාවත් නැකත් තමයි. මට නම් ඉතිං අවුරුද්දක වැදගත්ම අංගය වන්නේ අවුරුදු උත්සවයම තමයි.

අවුරුද්ද පුරාම වැඩ කරලා, ප්‍රශ්න වලින් හෙම්බත්වෙලා ටාගට් වලට යන්න උත්සහ කරලා වෙර වෙලා ඉන්න අපට දවස පුරාම නිදහසේ යාළු මිත්‍රයොත් සමග කාල බීල ගත කරන්න ලැබෙන එකේ වටිනාකම කියලා වැඩක් නැහැ. මේ අවුරුදු උත්සවත් නැත්තම් සමහර විට අපේ සම්බන්ධකම් මොබයිල් අන්තර්ජාල හරහා විතරක් වෙන්න ඉඩ තියෙනවා. මොන තරම් නවීන පහසුකම් තිබුණත් කෙනෙක් මුණ ගැහිලා කථා කරල ලබන සතුට ගන්න පුළුවන්ද ? ඇඟට දැනෙනවද ? ඒ නිසාම වෙන්න ඇති ඒ කාලේ ඉඳලම අවුරුද්දට ඥාති මිත්‍ර නෑගම් යන පුරුද්ද ඇතිවෙන්න ඇත්තේ. ඉතිං දවස පුරාම කාලා බීල විනෝද වෙලා හවසට සංගීත රසයකුත් ලබා දෙනවනේ අපේ ටෙක් එකේ කට්ටිය. ඒ නිසා මේ අවස්ථාව මග හරින්න එපා. එහෙම කට්ටියකුත් ඉන්න නිසා මං කිව්වේ.
අවුරුද්දක් පුරාම විවිධ ප්‍රශ්න අපේ ඇගේ ගොඩනැගෙන ප්‍රෙශර් එක එදාට රිලීස් කර ගමු.

### අවවාදය

ඕස්ට්‍රේලියාවෙ කොහේ හැරි මංකොල්ලයක් මිනී මැරුමක් උන ගමන් අපි කියන්න පුරුදු වෙලා ඉන්නේ අපොයි රටකට ගිය කලක්, ඉස්සර නම් මෙහෙම නැහැ, කොහොම තිබ්බ රටද යනාදී වශයෙන්.

තවත් ටිකක් එහාට ගිහින් මේ කල්ලොයි අරාබි කාරයොයි ආවට පස්සේ තමයි මේ සේරම කියලත් කියාවි. හැබැයි අපි එහෙම කිය කිය ඉන්නවා මිසක් අර JR උන්නැහේ කිව්ව වගේ තමන්ගේ ආරක්ෂාව තමන් බලාගෙන ඉන්න විදියක් ගැන හිතනවා බො-හොම අඩුයි. රටේ හැටියට සෙට් වෙන මිනි ස්සු ඉන්නෙ කීයෙන් කී දෙනාද?

මුලින්ම අපි තේරුම් ගන්න ඕනේ දෙයක් තමයි දැං මේ රටේ ජනගහනය සීඝ්‍රයෙන් වැඩිවෙනවා සංක්‍රමනිකයෝ නිසා. රටේ නිශ්පාදන කර්මාන්ත ක්‍රමයෙන් අඩුවේගෙන යනවා. ඒ අනුව රැකියා ඉඩ ප්‍රස්ථාත් අඩු වෙනවා. ඉතිං අසහනය වැඩි වෙන එක අහන්න දෙයක්ද?
මේ මොනවා උනත් මේ රටේ තිබුනේ හොඳ සුපිරි පාරිභෝගික සමාජයක් නිසා සාප්පු සංකීර්ණ තුල සුබෝපබෝගී බඩු පිරිලා තියෙනවා. මිනිස්සුන්ගේ අවශ්‍යතා වැඩි වෙනවා මිසක් අඩු වෙන්නෙ නැහැනේ. තමන්ගේ අවශ්‍යතා සපුරාගන්න මිනිස්සු මොන ක්‍රමයෙන් හරි මුදල් හොයන්න පෙළඹෙනවා. මංකොල්ල කෑම් වලට පො-හොසතාගේ සිට අහිංසක විශ්‍රාමික වයසක තැනැත්තා දක්වා ලක් වෙන්නේ ඒ නිසා. කඩ සාප්පු වල පෙට්‍රල් ස්ටේෂන්වල පිහි ඇනුම් ඇතිවෙන්නෙ ඒ නිසා. ඉතිං අත කන කර පුරා රත්‍රං පැළඳගෙන නවීන වාහන වලින් යන එන උදවිය ප්‍රහාරයන්ට ලකම්ම අරුමය-ක්ද?

මං මේ කියන දේවල් අලුත් හෝ අමුතු දේ නොවෙයි අපි හැමෝම දන්නා කාරනායි. ඒ අප අපේ පුරුදු රටාවන් වෙනස් කරන්න සූදානම් නැහැ ඇත්තටම අපේ ගෙවල් වලට හොරු පනිනවා නෙවෙයි පන්න ගන්නවා කියලයි මට හිතෙන්නේ. ආසියාතිකයින් වන අප කොහෙවත් ප්‍රදර්ශනාත්මක ගතිය ඉහළින්ම ඇති කොටසක්නේ ආහරණ පළඳින්නේ අවශ්‍යතාවට නෙවෙයි ප්‍රදර්ශණයටයි කියන එක තමයි තිත්ත ඇත්ත. ඒ නිසාම අපි හොරුන්ගේ පහසු ඉලක්ක බවට පත්වෙනවා. බොහෝ වෙලාවට හොරු පනින්නෙම ශ්‍රී ලංකාවේ ඉන්දියන් බංගලි ජාතිකයන්ගේ නිවෙස්වලටමයි. ඒක පහුගිය දවස්වල ප්‍රධාන ප්‍රවෘත්තිවලින් අපි



දැක්කනේ.

ඉතිං මම නම් කියන්නේ තමන් කැමති දේවල් කරන්න. ඒත් ජීවිත කාලයක් පුරා දහඩිය මහන්සියෙන් හොයපු වස්තුව ප්‍රවේසම් කර ගැනීම උදෙසා දැනට වඩා වගකීමෙන් හැසි-රෙන්න. ඒ සඳහා සුදුසු ආරක්ෂක පියවරයන් යොදා ගන්න. විශේෂයෙන් තමන්ගේ ළමා දරුවන් නිවෙස්වල තනියෙන් තබා නොයන්න. ප්‍රතිඵල දරුණු වේවි. ප්‍රතිකර්මයන්ට වඩා වලක්වා ගැනීම වැදගත් නිසයි ලිව්වේ.

### ක්‍රිකට් හා ගොන්පාට්

ඔවර 20 තරගාවලිය පරාජය උන පකිස්තාන් ටීම් එක ආපසු මව්බිමට යද්දි ඔවුන්ට ලැබුනු අම්හිරි ජනක ප්‍රතිචාර ගැන අපේ වැඩපලේ සගයෝටික දක්වපු උපහා සාත්මක කතා බහක් ඊයේ තිබුණ බටහිර ඉන්දීය හා ඉන්දියන් තරගයේදී ඉන්දියාව වැරදීම ගැන සතුටු වෙමින්. අන්තර්ජලයේ අපේ ශ්‍රී ලාංකික ක්‍රිකට් ලෝලියෝ දක්වලා තියෙන ප්‍රතිචාරත් දැකලා නැවතත් ක්‍රිකට් ගැනම ලියන්න හිතුනා. අපේ මිනිස්සුන්ගේ මුස්ලිම් රටවල් එක්ක පුදුම විරෝධයක්නේ තියෙන්නේ. ඒකෙන් කියන්නේ අපට හැමදාම උදව් කිරපු ජාතියක් එක යුද්දෙදි ආර්ථිකයෙදි මෙන්ම ක්‍රීඩාවෙදීත් ඔප්පු කරලා හමාරයි. ඉන්දියාව උනත් එහෙම තමයි. අසල්වාසී රටක් ලෙස අපිත් එක්ක ප්‍රශ්න තිබුනත් හැම විටම ඔවුන් අපිට උදව් කල එක අමතක කිරීම ගුනමකුකමක් ලෙස තමයි මටනම් හැගෙන්නේ දැන් අපි කතාතරන්නේ ක්‍රිකට් ගැනනේ. මේ ක්ෂේත්‍රයේදී පකිස්තානේ ඉන්දියාවේ හිටියෙත් අපිත් එක්කමයි. උන් හිටියේ නැත්තම් අපිට. තව සෑහෙන කාලෙකට ටෙස්ට් වරම් හම්බ වෙන්නෙත් නැහැ. 96 වල්ඩ් කප් එකේදී ක්‍රිකට් ලොක්කෝ අපට වර්ජනය කරද්දි අපට සපෝ ට් කලේ උන් විතරයි. ඒව මතක තබාගත යුතු දේවල්. වෙස්ට් ඉන්ඩීස්ලා හැමදාම හිටියේ අපට විරුද්ධ පිලේ අනික් කාරනේ තමයි මේ රටවල් දෙකේ මිනිස්සු ක්‍රීඩාවට ගත්තත් කලාවට ගත්තත් හදවතින්ම බැඳිලා ඉන්න ජාතියක්. ඒ බැඳීම් නිසාම තමයි ඔවුන්ගේ ප්‍රතිචාර දරුනු වෙන්නෙත්. ඒක හරි හෝ වැරදි වීම වෙනම කාරණයක් අපි ඊට වෙනස් අපිට දුක සැප කෝකත් එකයි. ඒ අපේ සංස්කෘතිය හුරු කරලා තියෙන හැටිනේ. ඒ වගේම තමයි අපට ජය පරාජය දෙකම දරා ගන්න පුළුවන් වෙන්නත් ඕන. මෙතුවක් කල් එහෙම උනා. ඒවා එහෙම වෙන්න ආත්ම ශක්තියක් හා හොඳ කොන්දක් තිබිය යුතුමයි. කුපිත වෙන්න පැරදුනත් පරාජය නිහතමානීව භාරගෙන වගකීමෙන් කටයුතු කල යුතුය. එකෙන් පැනල යන්න හොඳ නැහැ. වගකීම යනු නායකත්වයක මූලික කොන්දේසියක්. පරාජයක වගකීම මුහුන නොදී ඒ වෙනුවෙන් අහිංසකයෙක් බිල්ලට දෙන එක අර පෙර නායකයා අගය කරපු



සංස්කෘතියේ කොටසක් වෙන්න බැහැනේ. ඒක තනිකර ගොන්පාට් එකක්. ඒවා එහෙම වෙනකොට පුහුනු කරුයි කළමණාකරුයි හිටියේ බුදියගෙනද? භාෂාව සංනිවේදනය කිරීමේ අවුලක් තියෙනම් ක්‍රිකට් බෝඩ් එකේ හරි තේරීම් කමිටුවේ කාටවත් ඒ ගැන මුකුත් කරන්න තිබුනේ නැද්ද ? ඒක එහෙම උනේ කොහොමද පිස්සු හැදෙනවා දයාසිරි අන්න ඒක තමයි අපි මුලින් කිව්වේ ක්‍රිකට් ඉදිරියට යයි ඒත් ගොඩ යන්න තව කල් යයි කියලා.

### ක්‍රිකට් අහවරයි ? නෑ......

20/20 ක්‍රිකට් උනුසුමත් අහවරයි. සෑම තරගාවලියකටම පසු දැනෙන හැඟීම මෙවර තදින් දැනී ඇති බව තේරුනේ හමු වන සියළු ක්‍රිකට් ලෝලීන්ගේ ප්‍රතිචාරවලින්. බහුතරයගේ තියෙන්නේ නෙගටිව් ආකල්පයක්. ඒක එක අතකට අසාධාරණයි. මොකද මේ විවේචන කරන මහත්වරු කිසි කෙනෙක් මේකට මුල් උන හැබෑ හේතුව ගැන සොයල බලලා කරන විවේචනයක් නෙ-වෙයි කරන්නේ. හැමෝම ටීවී එකටයි බෝඩ් එකටයි බනින එකනේ කරන්නේ. ඒකනේ ලේසිම විදිය. චූටි මල්ලි නම් දකින්නේ මේක මේ ටීවී එකේ හරි බෝඩ් එකේ හරි ප්‍රශ්නයක් විදියට නෙවෙයි. ඒක අපේ ක්‍රිකට් හා සමාජ සංස්කෘතියෙම අඩුපාඩුවක් විදියට මට දැනෙන්නේ. එකට හේතු ගොඩයි. ඒ ගැන පොතක් ලියන්න උනත් පුළුවන්. ඉතින් කෙටියෙන් නම් මේ ගැන කියන එක වටිනවා.

මෙහෙමයි
අපේ ක්‍රිකට් ඉතිහාසයට වකවානු දෙකයි 96 ලෝක කුසලානය දිනා ගැනීම දක්වා හා ඉන්පසු අද දක්වා වන කාලය. මේ කාල පරාසයන් දෙක තුල ක්‍රිකට් වෙනුවෙන් කැපවුණා. 1 මිනිසුන්ගේ හැසිරීම් රටාව හා ඊට සමානව රට තුළ ඒ වෙනුවෙන් බිහිවුන සමාජ වටපිටාව දෙස සංසන්දනාත්මකව සොයලා බැලුවොත් මේ කඩා වැටීම හේතු හොය ගැනීම අපහසු නැහැ. සරලවම කිව්වොත් 96 දක්වා අප ක්‍රිකට් ගොඩ ගන්න හදපු ජාතියක්. 96 පසු අප ක්‍රිකට්වලින් ගොඩ යන්න හදන ජාතියක්. ඊට අදාල චූටි කාරණාවක් මං කියන්නම්. 96 දක්වා අපි පරම්පරා ගනන් වීදියේ පාරේ වෙලේ පිට්ටනියේ ඉඳලා හොඳ ග්‍රවුන්ඩ් දක්වාම අහු උන තැන ක්‍රිකට් ගහපු මින-ිස්සු එක ග්‍රවුන්ඩ් එකේ කණ්ඩායම් 10ක් විතර තැන් තැන්වල ක්‍රිකට් ගැහුව මතක ඇති. ඒ ඉඩ කඩ පහුගිය කාල සීමාව තුල කොතරම් ඇහිරී ඇද්ද කියා කොළඹ අවටම පමණක් සංචාරය කලහොත් ඔබට වැට-හේවී. කොළඹම විතරක් පිට්ටනි කීයක් නම් නැතිවෙලා ගිහින්ද ඒ සේරම ගොඩ නැගිලි හදලා විකුනලා. ඒක රටේම පොදු තත්වක් ක්‍රීඩාවට පෙර තිබූ නිදහස ඉඩ දැන් නැහැ. ඒවා පිලිගත් තැන්වල පමණක් සීමා වෙලා.



පෙර පාසල් ගොස් සවස වෙනකම් ක්‍රීඩා කරපු පරම්පරාව අද පුහුනුව නැමැති කාල පරාසයට පමනක් සීමා කොටු කරලා. එහෙම ජවසම්පන්න ක්‍රීඩකයෝ බිහි කරන්න පුළුවන්ද ? ඉස්සර බිහිඋන හැම ක්‍රීඩකයෙක් වගේම පිස්සුවෙන් වගේ ක්‍රිකට් ගහපු එවුන් අද එහම නැති එක ජාතික ප්‍රශ්නයක් වෙලා

අනෙක ඉතිං ක්‍රීඩාවක් වෘත්තියක් බවට පත්වුනාම එකෙ තියෙන උන ගැම්ම නැති වෙනවනේ ඉබේම. ඊටත් පස්සේ ඒවා කොන්ත්‍රාත්තු වෙනවා. කොහොම හරි ඉතිං මොකක් හරි වෙලා ඉදිරියට යන එක නම් ෂුවර්. හැමෝම කියනවා වගේ දැං ඉතිං ලංකාවේ ක්‍රිකට් ඉවරයි කියලා චූටි මල්ලි නම් කීයටවත් හිතන්නේ නැහැ. මොකද මයිකල් තිසේරලා අනුර තෙන්නකෝන්ලා, ගියාට වර්නපුරලා පෙරමුනට ආවේ. ඒ ගොල්ලෝ ගියහම දුලිප්ලා රෝයිලා මඩුගල්ලලා ගොඩ ගත්තේ නැද්ද? එයාලා ගියාට වැටුනද නෑනේ. යස අගේට අර්ජුනලා අරවින්දලා ගුරාලා ගේම දුන්නේ. ඊට පස්සේ නේද සනා මහේල සංගලා සෙට් උනේ. දැං ඒගොල්ලොත් ගිහිං තව කවුරු හරි ඒවි. ඔය මැතිව්ලා සිරිවර්ධනලා කුසල්ලා හේම ඉන්නේ. හැබැයි ඉතිං ඒකත් මේ පාර නම් ටිකක් කල් ඉන්න වෙනවා ගොඩ යන්න එක ෂුවර්. කමත් නැහැ ඉමු නේ......

**චූටි මල්ලි**